51908

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Examinations, Sri Lanka

60 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දුම්බර ප්‍රාදේශීය රෝහලේ, දුම්බර පොලිස් ස්ථානයේ සහ සකසුරුවම් හා ණය සමුපකාර සමිතියේ මානව සම්පත් දායකත්වයෙන් ද ගැමුණු රබර් නිෂ්පාදන ව්‍යාපාරයේ අයිතිකරු වන ගැමුණුගේ හා ඔහුගේ කාර්ය මණ්ඩලයේ මූල්‍ය අනුග්‍රාහකත්වයෙන් ද 'ඩෙංගු වළක්වා ගනිමු' යන මැයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් දුම්බර මහා විද්‍යාලයේ දී පවත්වන ලදී. එම වැඩසටහනට දුම්බර මහා විද්‍යාලයේ හා මැදලන්ද විද්‍යාලයේ සිසුන්, ගුරුවරුන් හා දෙමාපියන් සහභාගී විය.

**1.** ඉහත සිද්ධියේ ඇතුළත් 'ඩෙංගු වළක්වා ගනිමු' යන දැනුවත් කිරීමේ වැඩසටහන මගින් සපුරාලන මිනිස් අවශ්‍යතාව කුමක් ද?

(1) සෞඛ්‍යය (2) අධ්‍යාපනය (3) ආරක්ෂාව (4) විනෝදය

**2.** දුම්බර මහා විද්‍යාලයේ අභ්‍යන්තර පරිසර සාධකයක් සඳහා නිදසුනක් වන්නේ,

(1) දුම්බර මහා විද්‍යාලයේ සිසුන් හා ගුරුවරුන් ය.
(2) දුම්බර මහා විද්‍යාලයේ සිසුන් හා දෙමාපියන් ය.
(3) මැදලන්ද විද්‍යාලයේ සිසුන් හා ගුරුවරුන් ය.
(4) මැදලන්ද විද්‍යාලයේ ගුරුවරුන් හා දෙමාපියන් ය.

**3.** ඉහත සිද්ධියේ ඇතුළත් පෞද්ගලික අංශයේ ව්‍යාපාරයක් වන්නේ,

(1) දුම්බර ප්‍රාදේශීය රෝහල ය. (2) සකසුරුවම් සහ ණය සමුපකාර සමිතිය ය.
(3) දුම්බර මහා විද්‍යාලය ය. (4) දුම්බර පොලිස් ස්ථානය ය.

**4.** දුම්බර ප්‍රාදේශීය රෝහල,

(1) ඖෂධ නිෂ්පාදන ව්‍යාපාරයකි. (2) ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයකි.
(3) සේවා සපයන ව්‍යාපාරයකි. (4) පෞද්ගලික අංශයේ ව්‍යාපාරයකි.

**5.** ගැමුණු රබර් නිෂ්පාදන ව්‍යාපාරයේ නිෂ්පාදන සාධකයක් වන 'ව්‍යවසායකත්වය' සඳහා නිදසුනක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) නිෂ්පාදිත සඳහා භාවිත කරන රබර් (2) ව්‍යාපාරයට යොදවා ඇති මුදල්
(3) ව්‍යාපාරයේ අයිතිකරු වන ගැමුණු (4) ව්‍යාපාරයේ සේවකයින්

[දෙවැනි පිටුව බලන්න.

CamScanner

6. පුපුන් විදුලි පහන් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරයට තර්ජනයක් වන්නේ,
   (1) පුහුණු සේවකයින් ව්‍යාපාරය හැර යාම ය.
   (2) සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන පහන් සඳහා ඉල්ලුම ඉහළ යාම ය.
   (3) ව්‍යාපාරය ලබාගෙන ඇති බැංකු ණය මුදලේ වාරිකය නොගෙවීම ය.
   (4) ව්‍යාපාරයේ මූල්‍ය වාර්තා අවිධිමත් ලෙස පවත්වාගෙන යාම ය.

7. රුවන් වේවැල් ආශ්‍රිත නිෂ්පාදන තම නිවසේ දී නිෂ්පාදනය කර, ගෙයින් ගෙයට ගොස් අලෙවි කරයි. රුවන්,
   (1) ස්ථාවර මහා පරිමාණ සිල්ලර වෙළෙන්දෙකි.
   (2) ස්ථාවර සුළු පරිමාණ සිල්ලර වෙළෙන්දෙකි.
   (3) සංචාරක සුළු පරිමාණ තොග වෙළෙන්දෙකි.
   (4) සංචාරක සුළු පරිමාණ සිල්ලර වෙළෙන්දෙකි.

8. ව්‍යාපාර කෙරෙහි බලපාන ආර්ථික පරිසර සාධකයක් **නොවන්නේ** කුමක් ද?
   (1) පොලී අනුපාතය
   (2) විදේශ විනිමය අනුපාතය
   (3) සාක්ෂරතා අනුපාතය
   (4) උද්ධමන අනුපාතය

9. ගයාන් තම ගුවන් ගමන් ටිකට්පත මිල දී ගෙන ලංකා බැංකු හර පතකින් ගෙවීම් කරන ලදී. මෙම ගනුදෙනුව සිදු කිරීමට ගයාන් සතුව, ලංකා බැංකුවේ
   (1) ණය පතක් තිබිය යුතු ය.
   (2) කිසිදු ගිණුමක් තිබිය යුතු නැත.
   (3) වියදම් කළ මුදලට සමාන ශේෂයක් සහිත ස්ථාවර තැන්පතුවක් තිබිය යුතු ය.
   (4) වියදම් කළ මුදලට සමාන ශේෂයක් සහිත ඉතිරි කිරීමේ ගිණුමක් තිබිය යුතු ය.

10. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ ක්‍රියාත්මකවන බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වන්නේ,
   (1) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවයි.
   (2) ජාතික ඉතිරි කිරීමේ බැංකුවයි.
   (3) සණස සංවර්ධන බැංකුවයි.
   (4) මහජන බැංකුවයි.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක **11** හා **12** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පියල් කුලී ත්‍රී රෝද රථයක ගමන් කරමින් සිටිය දී රථය අනතුරකට භාජනය වී ඔහු සුළු තුවාල ලබයි. එම අවස්ථාවේ දී ම ත්‍රී රෝද රථය පැද වූ හිමිකරු විසින් ත්‍රී රෝද රථය රක්ෂණය කර තිබූ සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සමාගමට මෙම අනතුර පිළිබඳව ජංගම දුරකථනයෙන් කෙටි පණිවිඩයක් මගින් දැනුම් දෙන ලදී.

11. ඉහත සිද්ධියට අනුව රක්ෂණයට සම්බන්ධ පළමු පක්ෂය, දෙවන පක්ෂය හා තෙවන පක්ෂය පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) පියල්, ත්‍රී රෝද රථ හිමිකරු හා සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සමාගම
   (2) සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සමාගම, පියල් හා ත්‍රී රෝද රථ හිමිකරු
   (3) ත්‍රී රෝද රථ හිමිකරු, සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සමාගම හා පියල්
   (4) ත්‍රී රෝද රථ හිමිකරු, පියල් හා සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සමාගම

12. ඉහත සිද්ධියට අදාළ අනතුර වාර්තා කිරීම සඳහා ත්‍රී රෝද රථ හිමිකරු භාවිත කළ කෙටි පණිවිඩය අයත්වන සන්නිවේදන මාධ්‍ය කුමක් ද?
   (1) විද්‍යුත් වාචික
   (2) විද්‍යුත් ලිඛිත
   (3) සංඥා ලිඛිත
   (4) විද්‍යුත් සංඥා

13. ප්‍රවාහන මූලිකාංග සහ ඒවාට අදාළ නිදසුන් පහත වගුවේ දැක්වේ.

| ප්‍රවාහන මූලිකාංග | ප්‍රවාහන මූලිකාංග සඳහා නිදසුන් |
|---|---|
| 1. මාර්ගය | A - නවීන පහසුකම් සහිත ඉන්ධන පිරවුම් හලක් විවෘත කිරීම |
| 2. මාධ්‍යය | B - මීරිගම සිට කුරුණෑගල දක්වා අධිවේගී මාර්ගය විවෘත කිරීම |
| 3. බලය | C - යාපනයේ නව දුම්රිය ස්ථානයක් පිහිටුවීම |
| 4. පර්යන්තය | D - ගල්කිස්ස සිට කන්කසන්තුරය දක්වා සුඛෝපභෝගී දුම්රියක් යෙදවීම |

ඉහත දී ඇති ප්‍රවාහන මූලිකාංග අනුපිළිවෙළ අනුව, නිදසුන් නිවැරදිව ගළපන ලද පිළිතුර තෝරන්න.
   (1) B, D, A, C
   (2) B, D, C, A
   (3) D, B, A, C
   (4) D, C, A, B

/තුන්වැනි පිටුව බලන්න.

CamScanner

14. විකුණුම් කළමනාකරු විසින් 2021 වර්ෂයේ විකුණුම් ඇගයීමට ලක් කිරීම කළමනාකරණ ක්‍රියාවලියේ ......①...... ට අයත් වන අතර, 2022 වර්ෂයේ දී 5% ක වට්ටමකට යටත් ව භාණ්ඩ විකිණීම, අලෙවිකරණ මිශ්‍රයේ ......②...... විචල්‍යයට අයත් වේ.

ඉහත ① හා ② යන ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) පාලනය, ප්‍රවර්ධනය (2) සැලසුම්කරණය, මිල
(3) සැලසුම්කරණය, ප්‍රවර්ධනය (4) පාලනය, මිල

15. රංග විසින් උපයාගත් රු. 250 000 ක මුදල සීමාසහිත පොදු සමාගමක සාමාන්‍ය කොටස්වල ආයෝජනය කළේ ය. 2021 වර්ෂයේ එම සමාගම ඉපැයූ ලාභයෙන් රු. 10 000 ක් ඔහුට හිමි විය. පසුව සියලු කොටස් රු. 350 000 කට විකුණන ලදී. මෙම ආයෝජනයෙන් රංග උපයාගත් ප්‍රතිලාභ හැඳින්වෙන යෙදුම් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) පොලී ආදායම්, ලාභාංශ (2) ලාභාංශ, ප්‍රාග්ධන ලාභ
(3) ලාභ, ප්‍රාග්ධන ලාභ (4) ප්‍රාග්ධන ලාභ, පොලී ආදායම්

16. නිශ්චිත ප්‍රතිලාභ අනුපාතයක් රහිත ආයෝජන මාර්ගය කුමක් ද?

(1) ස්ථාවර තැන්පතු (2) භාණ්ඩාගාර බිල්පත්
(3) ඉතිරිකිරීමේ තැන්පතු (4) සාමාන්‍ය කොටස්

17. ද්විත්ව සටහන් මූලධර්මය අනුව අඩුවීම හර, වැඩිවීම බැර ලෙස සටහන් කෙරෙන ගිණුම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ණයහිමි ගිණුම, ගැනිලි ගිණුම, විකුණුම් ගිණුම, රක්ෂණ ශාස්තු ගිණුම
(2) බැංකු ණය ගිණුම, ණයහිමි ගිණුම, දුන් වට්ටම් ගිණුම, කොමිස් ආදායම් ගිණුම
(3) වැටුප් ගිණුම, ණයගැති ගිණුම, වේතන ගිණුම, මුදල් ගිණුම
(4) ප්‍රාග්ධන ගිණුම, ණයහිමි ගිණුම, බැංකු ණය ගිණුම, ලද වට්ටම් ගිණුම

18. ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයක ජංගම නොවන වත්කමක් වන්නේ,

(1) ලැබිය යුතු ගොඩනැගිලි කුලී ය. (2) විකිණීමට තබා ඇති ලී බඩු ය.
(3) වඩු මේසය ය. (4) අතැති මුදල් ය.

● පහත තොරතුරු ඇසුරෙන් අංක **19** සිට **21** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

A – රු. 25 000 ක බඩු තොගයක් අත්පිට මුදලට ගැනීම
B – රු. 10 000 කට මිල දී ගත් බඩු තොගයක් රු. 12 000 ට ණයට විකිණීම
C – ණයගැතියකුගෙන් රු. 5 000 ක මුදලක් ලැබීම
D – ව්‍යාපාරයේ කාර්යාලයට රු. 50 000 ක මේසයක් ණයට ගැනීම

19. ඉහත ගනුදෙනු අතුරෙන් ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයෙහි හිමිකම කෙරෙහි බලපාන ගනුදෙනුව වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

20. ඉහත ගනුදෙනුවලින් පසු මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයෙහි වත්කම්වල අගය වැඩි වන්නේ

(1) රු. 15 000 කිනි. (2) රු. 17 000 කිනි.
(3) රු. 52 000 කිනි. (4) රු. 92 000 කිනි.

21. ඉහත ගනුදෙනුවලට පෙර මෙම ව්‍යාපාරයේ මුළු වගකීම් රු. 80 000 ක් වූයේ නම්, මෙම ගනුදෙනුවලින් පසු මුළු වගකීම්වල අගය කොපමණ ද?

(1) රු. 75 000 (2) රු. 90 000 (3) රු. 130 000 (4) රු. 142 000

22. භාවිත කළ කාර් රථ මිල දී ගෙන විකුණන ව්‍යාපාරයක්, රු. 2 000 000 කට කාර් රථයක් විකිණීම සඳහා ණයට ගැනීම සටහන් කෙරෙන මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත පිළිවෙළින්,

(1) ගෙවීම් වවුචරය සහ ගැනුම් ජර්නලයයි. (2) ජර්නල් වවුචරය සහ පොදු ජර්නලයයි.
(3) ගැනුම් ඉන්වොයිසිය සහ පොදු ජර්නලයයි. (4) ගැනුම් ඉන්වොයිසිය සහ ගැනුම් ජර්නලයයි.

23. ණයගැතියකු වූ රවීගෙන් ලැබුණු රු. 15 000 ක චෙක්පත, ව්‍යාපාරයේ ලෙජරයේ සටහන් කර ඇත. එම චෙක්පත බැංකු ගිණුමේ තැන්පත් කරන විට තැබිය යුතු නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) බැංකු ගිණුම හර රු. 15 000
මුදල් ගිණුම බැර රු. 15 000

(2) බැංකු ගිණුම හර රු. 15 000
රවීගේ ගිණුම බැර රු. 15 000

(3) මුදල් ගිණුම හර රු. 15 000
බැංකු ගිණුම බැර රු. 15 000

(4) මුදල් ගිණුම හර රු. 15 000
රවීගේ ගිණුම බැර රු. 15 000

/හතරවැනි පිටුව බලන්න.

CamScanner

24. ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමය රු. 5 000 කි. 2022.01.31 දිනට මෙම ව්‍යාපාරයේ සුළු මුදල් පොතේ ශේෂය රු. 800 ක් විය. එදින ලෙජරයට මාරු කළ, සුළු මුදල් පොතේ වියදම් තීරුවල මුළු එකතුව

(1) රු. 800 කි. (2) රු. 4 200 කි. (3) රු. 5 000 කි. (4) රු. 5 800 කි.

25. ජර්නල් වවුචරය මූලාශ්‍ර ලේඛනයක් ලෙස භාවිත කරන ගනුදෙනුව කුමක් ද?

(1) විකිණීම සඳහා රු. 10 000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම
(2) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 50 000 ක ලී බඩු අත්පිට මුදලට ගැනීම
(3) ව්‍යාපාරයට රු. 200 000 ක ණය මුදලක් මූල්‍ය ආයතනයකින් ලබා ගැනීම
(4) අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් රු. 5 000 ක භාණ්ඩ තොගයක් ලබා ගැනීම

26. සඳුන් තම පුතු කසුන්ගේ පන්ති ගාස්තු රු. 2 000 ක් ව්‍යාපාරයේ චෙක්පතකින් ගෙවන ලදී. මෙම ගනුදෙනුව සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන කුමක් ද?

(1) ගැනිලි ගිණුම හර රු. 2 000
බැංකු ගිණුම බැර රු. 2 000

(2) ගැනිලි ගිණුම හර රු. 2 000
මුදල් ගිණුම බැර රු. 2 000

(3) කසුන්ගේ ගිණුම හර රු. 2 000
බැංකු ගිණුම බැර රු. 2 000

(4) කසුන්ගේ ගිණුම හර රු. 2 000
මුදල් ගිණුම බැර රු. 2 000

27. අමල්ගේ ව්‍යාපාරයේ 2022.03.31 දිනට බැංකු ගිණුමේ ශේෂය, එදිනට බැංකු ප්‍රකාශයේ ශේෂයට වඩා අඩුවීමට හේතුවක් වන්නේ

(1) 2022.03.30 දින බැංකුවේ තැන්පත් කළ රු. 15 000 ක චෙක්පත නිශ්කාෂණය නොවීම ය.
(2) 2022.03.29 දින රුවන්ට නිකුත් කළ රු. 25 000 ක චෙක්පත බැංකුවට ඉදිරිපත් නොකිරීම ය.
(3) ස්ථාවර නියෝග මත බැංකුව රු. 1 000 ක මාර්තු මාසයේ රක්ෂණ ගාස්තුව ගෙවීම ය.
(4) බැංකුව මාර්තු මාසය සඳහා රු. 1 500 ක බැංකු ගාස්තුවක් අයකර තිබීම ය.

28. ව්‍යාපාරයක ගිණුම් වර්ෂයක් අවසානයේ දී පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමකින් අනාවරණය නොවන වරද දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) රු. 1 500 ක අත්පිට ගැනුම් මුදල් පොතේ පමණක් සටහන් වීම
(2) ණයහිමියකුට මුදල් ගෙවීමේ දී ලැබුණු රු. 500 ක වට්ටම, ලද වට්ටම් ගිණුමේ සටහන් නොවීම
(3) රු. 55 000 ක ණයට ගැනුම්, ගැනුම් ජර්නලයේ නිවැරදි ව සටහන් කර, අදාළ ණයහිමි ගිණුමට රු. 50 000 ක් ලෙස බැර කිරීම
(4) ගෙවූ රක්ෂණ ගාස්තු රු. 1 500 මුදල් පොතේ නිවැරදිව සටහන් කර වරිපනම් ගාස්තු ගිණුමට හර කර තිබීම

29. ව්‍යාපාරයක රු. 9 000 ක දුරකථන ගාස්තු ගෙවීම, දුරකථන ගාස්තු ගිණුමට හර කර ඇත්තේ රු. 900 ක් ලෙස ය. මෙම වරද නිවැරදි කිරීමට අදාළ ජර්නල් සටහන තෝරන්න.

(1) දුරකථන ගාස්තු ගිණුම හර රු. 8 100
මුදල් ගිණුම රු. 8 100

(2) දුරකථන ගාස්තු ගිණුම හර රු. 8 100
අවිනිශ්චිත ගිණුම රු. 8 100

(3) දුරකථන ගාස්තු ගිණුම හර රු. 9 000
අවිනිශ්චිත ගිණුම රු. 9 000

(4) දුරකථන ගාස්තු ගිණුම හර රු. 9 000
මුදල් ගිණුම රු. 9 000

/පස්වැනි පිටුව බලන්න.

CS CamScanner

30. සමගි ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් 100 ක් සිටින අතර එක් අයකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 50 කි. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂයේ සාමාජිකයින් 70 දෙනෙකුගේ වාර්ෂික සාමාජික මුදල් ලැබී ඇත. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයේ දැක්විය යුතු සාමාජික මුදල් ආදායම වන්නේ,
(1) රු. 3 500 කි. (2) රු. 5 000 කි. (3) රු. 42 000 කි. (4) රු. 60 000 කි.

● පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක **31** හා **32** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කේක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක 2022.03.31 දිනෙන් අවසන් මාසය තුළ කේක් කිලෝග්‍රෑම 1 000 ක් නිපදවීම සඳහා දරන ලද වියදම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| තිරිඟු පිටි .............................. | 100 000 |
| බිත්තර .............................. | 10 000 |
| අනෙකුත් ද්‍රව්‍ය .............................. | 20 000 |
| කේක් සාදන්නාගේ වැටුප ............ | 45 000 |
| ව්‍යාපාරයේ බදු කුලිය (මාසික) ....... | 10 000 |
| ව්‍යාපාරයේ විදුලි බිල (මාසික) ....... | 15 000 |

31. 2022.03.31 දිනෙන් අවසන් මාසය සඳහා කේක් නිෂ්පාදනයට අදාළ ප්‍රාථමික පිරිවැය වන්නේ,
(1) රු. 145 000 කි. (2) රු. 155 000 කි. (3) රු. 175 000 කි. (4) රු. 200 000 කි.

32. 10% ක ලාභාන්තිකයක් තබා ගන්නේ නම්, කේක් කිලෝග්‍රෑම් එකක විකුණුම් මිල කොපමණ ද?
(1) රු. 143.00 (2) රු. 192.50 (3) රු. 200.00 (4) රු. 220.00

● පහත තොරතුරු ඇසුරෙන් අංක **33** හා **34** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සුලෝචනගේ ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ මසකට රු. 10 000 බැගින් කුලී ගෙවන ගොඩනැගිල්ලක ය. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගොඩනැගිලි කුලී ලෙස රු. 80 000 ක් ගෙවා ඇත.

33. සුලෝචනගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගොඩනැගිලි කුලී ගැළපීමට අදාළ ජර්නල් සටහන තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | ගොඩනැගිලි කුලී ගිණුම | හර | රු. 40 000 | |
| | ගෙවිය යුතු කුලී ගිණුම | | | රු. 40 000 |
| (2) | ලැබිය යුතු ගොඩනැගිලි කුලී ගිණුම | හර | රු. 40 000 | |
| | ගොඩනැගිලි කුලී ආදායම් ගිණුම | | | රු. 40 000 |
| (3) | ගොඩනැගිලි කුලී ගිණුම | හර | රු. 80 000 | |
| | මුදල් ගිණුම | | | රු. 80 000 |
| (4) | ගොඩනැගිලි කුලී ගිණුම | හර | රු. 120 000 | |
| | ගෙවිය යුතු ගොඩනැගිලි කුලී ගිණුම | | | රු. 120 000 |

34. සුලෝචනගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගොඩනැගිලි කුලිය ඇතුළත් කළ යුතු වන්නේ,
(1) ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය රු. 40 000 ක් ලෙස ය.
(2) ලැබිය යුතු ගොඩනැගිලි කුලිය රු. 40 000 ක් ලෙස ය.
(3) ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය රු. 80 000 ක් ලෙස ය.
(4) ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය රු. 120 000 ක් ලෙස ය.

[හයවැනි පිටුව බලන්න.

CamScanner

● පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක **35** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කුසල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| විකුණුම් ........................ | | 450 000 |
| ගැනුම් ........................ | 200 000 | |
| 2021.01.01 දිනට තොගය ...... | 100 000 | |
| මෝටර් රථ (පිරිවැයට) .......... | 800 000 | |
| 10% බැංකු ණය .................. | | 100 000 |
| මුදල් ශේෂය ..................... | 15 000 | |
| රක්ෂණ ගාස්තු .................. | 7 000 | |
| ලද ගෙවල් කුලී .................. | | 3 000 |
| ලිපිකරු වැටුප් .................. | 12 000 | |
| 2021.01.01 දිනට ප්‍රාග්ධනය .... | | 600 000 |
| ණයගැතියෝ ..................... | 46 000 | |
| ණයහිමියෝ ..................... | | 35 000 |
| බැංකු ණය පොලී ................ | 8 000 | |
| | 1 188 000 | 1 188 000 |

අතිරේක තොරතුරු :

1. 2021.12.31 දිනට ඉතිරි තොගය රු. 80 000 කි.
2. 2021.12.31 දිනට ණයගැතියන්ගෙන් රු. 4 000 ක් බොල් ණය ලෙස කපාහැරිය යුතු ය.
3. 2021.12.31 දිනට ලැබිය යුතු ගෙවල් කුලී රු. 2 000 කි.

**35.** කුසල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය

(1) රු. 150 000 කි. (2) රු. 220 000 කි. (3) රු. 300 000 කි. (4) රු. 380 000 කි.

**36.** කුසල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂයේ දළ ලාභය

(1) රු. 70 000 කි. (2) රු. 150 000 කි. (3) රු. 230 000 කි. (4) රු. 300 000 කි.

**37.** කුසල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය

(1) රු. 200 000 කි. (2) රු. 202 000 කි. (3) රු. 204 000 කි. (4) රු. 206 000 කි.

**38.** කුසල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට මුළු වගකීම්වල වටිනාකම

(1) රු. 37 000 කි. (2) රු. 100 000 කි. (3) රු. 135 000 කි. (4) රු. 137 000 කි.

**39.** කුසල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට මුළු වත්කම්වල වටිනාකම

(1) රු. 937 000 කි. (2) රු. 939 000 කි. (3) රු. 941 000 කි. (4) රු. 943 000 කි.

**40.** කුසල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට හිමිකම

(1) රු. 202 000 කි. (2) රු. 600 000 කි. (3) රු. 802 000 කි. (4) රු. 804 000 කි.

❊ ❊

CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**60 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

| | |
|---|---|
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | I, II |
| வணிகக் கல்வியும் கணக்கீடும் | I, II |
| Business and Accounting Studies | I, II |

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**උපදෙස්:**

✳ **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

✳ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවලදී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

**1.** පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කළමනාකරණ උපාධිධාරියකු වූ අවදානම් දැරීමට කැමති සුභවාදී අදහස් දරන දිවාන්, සංචාරක පාරාදීසයක් වූ කොග්ගල ග්‍රාමයේ වාසය කරයි. ඔහු මඩොල්දූව නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට කොග්ගල වැව හරහා මඩොල්දූවට යාම සඳහා බෝට්ටු සේවා සැපයීමට 'ගගුලි සෆාරි' නමින් ව්‍යාපාරයක්, තමා සතු රු. 800 000 ක මුදල ද, වාර්ෂිකව 12%ක පොලියට රු. 500 000 ක බැංකු ණයක් ද යොදවා 2022.01.01 දින ආරම්භ කළේ ය. එදින ම ඔහු රු. 800 000 ක්ට සෆාරි බෝට්ටුවක් ද රු. 120 000 කට ආරක්ෂිත ඇඳුම් කට්ටල ද අත්පිට මුදලට ගත් අතර, රු. 35 000 ක මාසික වැටුපකට පළපුරුදු බෝට්ටු රියදුරකු වූ තිලක් ද, රු. 10 000 ක මාසික වැටුපකට නුපුහුණු සේවකයකු වූ කුමාර ද බඳවා ගත්තේ ය. එදින ම සංචාරක නිකේතන බහුලව පිහිටි මඩොල්දූවට ඉතා නුදුරින්, ව්‍යාපාරික ස්ථානය සඳහා ගොඩනැගිල්ලක් මසකට රු. 7 000 ක කුලී පදනම මත ලබා ගන්නා ලදී.

2022.01.31 දිනෙන් අවසන් මාසය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| • ගෙවූ ඉන්ධන වියදම් ..................................... | 85 000 |
| • ගෙවූ රක්ෂණ ගාස්තු ..................................... | 8 000 |
| • ගෙවූ තොටුපළ ගාස්තු ..................................... | 15 000 |
| • ගෙවූ වෙනත් වියදම් ..................................... | 20 000 |
| • ලැබූ මුළු බෝට්ටු සේවා ආදායම ............................ | 310 000 |

ජනවාරි මාසයේ ව්‍යාපාරයේ ආදායම් හා වියදම් විශ්ලේෂණය කිරීමෙන් පසු, පෙබරවාරි මාසයේ සිට තවත් සෆාරි බෝට්ටු දෙකක් ණය පදනම මත ලබාගෙන ව්‍යාපාරය තවදුරටත් පුළුල් කිරීමට දිවාන් තීරණය කර ඇත.

**අමතර තොරතුරු :**

- සෆාරි බෝට්ටුව වාර්ෂිකව 12% බැගින් සහ ආරක්ෂක ඇඳුම් කට්ටල වාර්ෂිකව 50% බැගින් ක්ෂය කළ යුතු ය.
- ජනවාරි මාසයේ විදුලි බිල රු. 1 000 කි. එය 2022.01.31 දින වන විටත් ගෙවා නොමැත.
- ජනවාරි මාසයට අදාළ, බෝට්ටු රියදුරු සහ නුපුහුණු සේවක වැටුප ජනවාරි මාසය තුළ දී ගෙවා ඇති අතර, ගොඩනැගිලි කුලිය 2022.01.31 දින තෙක් ගෙවා නොමැත.

(i) (අ) 'ගගුලි සෆාරි' ව්‍යාපාරය මගින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව කුමක් ද?

(ආ) ව්‍යාපාර හිමිකාරත්වය අනුව 'ගගුලි සෆාරි' ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ii) 'ගගුලි සෆාරි' ව්‍යාපාරයේ, ව්‍යාපාර පරිසර සාධක පහක් පහත දැක්වේ.

(අ) කොග්ගල සංචාරක පාරාදීසය

(ආ) දිවාන්ගේ කළමනාකරණ උපාධිය

(ඉ) පළපුරුදු බෝට්ටු රියදුරු, තිලක්

(ඊ) නුපුහුණු සේවක, කුමාර

(උ) ව්‍යාපාර ස්ථානයට නුදුරින් පිහිටි මඩොල්දූව

ඉහත එක් එක් ව්‍යාපාර පරිසර සාධකය 'ගගුලි සෆාරි' ව්‍යාපාරයට ශක්තියක් ද, දුර්වලතාවක් ද, අවස්ථාවක් ද, තර්ජනයක් ද යන්න දක්වන්න. (පිළිතුරු ලිවීම සඳහා පහත ආකාරයේ වගුවක් භාවිත කරන්න. පළමු පරිසර සාධකය (අ) සඳහා පිළිතුර දී ඇත.)

[අවෙනි පිටුව බලන්න.

CamScanner

| ව්‍යාපාර පරිසර සාධකය | |
|---|---|
| (අ) | අවස්ථාවකි |
| (ආ) | |
| (ඉ) | |
| (ඊ) | |
| (උ) | |

(iii) 'ගඟුලි සෆාරි' ව්‍යාපාරය ඇසුරෙන් පහත සඳහන් කළමනාකරණ කාර්ය සඳහා නිදසුන බැගින් ලියන්න.
(අ) සංවිධානකරණය (ආ) පාලනය

(iv) 'ගඟුලි සෆාරි' ව්‍යාපාරය විසින් සපයනු ලබන සේවාවට අදාළව පහත නිෂ්පාදන සාධක සඳහා නිදසුන බැගින් ලියන්න.
(අ) භූමිය (ආ) ශ්‍රමය (ඉ) ප්‍රාග්ධනය (ඊ) ව්‍යවසායකත්වය

(v) (අ) 2022.01.01 දිනට 'ගඟුලි සෆාරි' ව්‍යාපාරයේ හිමිකම සහ වගකීම්වල වටිනාකම් වෙන වෙන ම ලියන්න.
(ආ) 2022.01.01 දිනට 'ගඟුලි සෆාරි' ව්‍යාපාරය සතු වත්කම් දෙකක් වටිනාකම් සහිතව ලියන්න.

(vi) (අ) 2022.01.31 දිනට 'ගඟුලි සෆාරි' ව්‍යාපාරයේ උපචිත විදුලිය රු. 1 000 සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය සහ මූලික පොත සඳහන් කරන්න.
(ආ) 'ගඟුලි සෆාරි' ව්‍යාපාරය රු. 120 000 කට ආරක්ෂිත ඇඳුම් කට්ටල අත්පිට මුදලට ගැනීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

(vii) 2022.01.31 දිනට 'ගඟුලි සෆාරි' ව්‍යාපාරයේ එක් එක් ජංගම නොවන වත්කමේ ශුද්ධ අගය වෙන වෙන ම දක්වන්න.

(viii) 2022.01.31 දිනට 'ගඟුලි සෆාරි' ව්‍යාපාරයේ මුදල් ශේෂය ගණනය කරන්න.

(ix) 2022.01.31 දිනෙන් අවසන් මාසය සඳහා 'ගඟුලි සෆාරි' ව්‍යාපාරයේ ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කර දක්වන්න.

(x) 'ගඟුලි සෆාරි' ව්‍යාපාරයේ,
(අ) 2022.01.31 දිනට හිමිකම කොපමණ ද?
(ආ) 2022.01.31 දිනට මුළු වත්කම්වල වටිනාකම කොපමණ ද? **(ලකුණු 02 × 10 = 20 යි)**

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

**2.** (i) සමුපකාර සමිතිවල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.
(අ) මිනිස් අවශ්‍යතා නිසඟයෙන් බිහිවන අතර වුවමනා නිර්මාණය කළ හැකි ය.
(ආ) ව්‍යාපාරයක තරගකරුවන් එහි අභ්‍යන්තර පරිසර සාධකයකි.
(ඉ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සේවා සැපයීමේ ව්‍යාපාරයකි.
(ඊ) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ වගකීම සීමිත වේ. (ලකුණු 02 යි)

(iii) සමන් තම පියා සමඟ පාසලේ සිට නිවස වෙත යන අතරේ දී සිදු වූ සිදුවීම් දෙකක් පහත දැක්වේ.
1. පියා, සුමුදු පොත් අලෙවිසැලෙන් සමන්ට සිතියම් පොතක් මිල දී ගැනීම
2. පියා, සීමාසහිත ලංකා සතොසෙන් හාල් කිලෝග්‍රෑම් පහක් මිලට ගැනීම

ඉහත එක් එක් සිද්ධිය තුළින් සපුරා ගනු ලැබූ මිනිස් අවශ්‍යතාව සහ එම අවශ්‍යතාව සපුරාලීමට අදාළ වූ ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය (අරමුණු අනුව) සඳහන් කරන්න. (පිළිතුරු සැපයීම සඳහා පහත ආකාරයේ වගුවක් භාවිත කරන්න.)

| සිද්ධිය | සපුරා ගනු ලැබූ මිනිස් අවශ්‍යතාව | අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය (අරමුණු අනුව) |
|---|---|---|
| 1 | | |
| 2 | | |

(ලකුණු 02 යි)

(iv) නයනා විසින් නුවරඑළියේ මල් වගා කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 'සකුරා මල්' නමින් සාර්ථකව පවත්වාගෙන යන අතර, පසුගිය වසරේ ඇති වූ දිලීර රෝගයක් නිසා ග්‍රාමීය බැංකු ණය වාරිකය ගෙවීමේ අපහසුතාවකට පත් විය. නමුත් ඇයගේ ව්‍යාපාර දැනුම, කැපවීම සහ කාබනික පොහොර ලබා දෙමින් රජය කළ දිරිගැන්වීම නිසා ඇය මෙම වසරේ සාර්ථක විය.
(අ) ඉහත සිද්ධියේ සඳහන් වන 'සකුරා මල්' ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශ්ව **දෙකක්** ලියන්න.
(ආ) ඉහත සිද්ධියේ සඳහන් 'සකුරා මල්' ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කිරීමට හේතුව ලියන්න. (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

/නවවැනි පිටුව බලන්න.

CamScanner

3. (i) ජංගම ගිණුමක් පවත්වාගෙන යාමේ වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) චෙක්පත් මගින් ගනුදෙනු කිරීමේ දී රේඛනය කිරීම අනිවාර්ය වේ.

(ආ) ජීවිත රක්ෂණය සඳහා හානිපූර්ණ රක්ෂණ මූලධර්මය අදාළ නොවේ.

(ඉ) සන්නිවේදන ක්‍රියාවලියක යවන්නා හා ලබන්නා අතර හුවමාරුවන පණිවුඩය සම්බන්ධ කරනුයේ සන්නිවේදන මාධ්‍යය මගිනි.

(ඊ) බොහෝවිට ගමනාන්තය තෙක් යොදාගත නොහැකි වීම, දුම්රිය මාර්ග ප්‍රවාහනයේ ඇති අවාසියකි. (ලකුණු 02 යි)

(iii) යාපනයේ අර්තාපල් වගා කරන රාජා කොළඹ සුපිරි වෙළඳසැලක් හිමි ප්‍රභාත්ට අර්තාපල් කිලෝග්‍රෑම් 50 ක් සිකුරාදා රාත්‍රී දුම්රියෙන් කොටුව දුම්රිය ස්ථානය වෙත එවන බව දුරකථනයෙන් දැනුම් දෙන ලදී. ප්‍රභාත් එම අර්තාපල් තොගය භාර ගැනීමට එකඟ වී රාජාට දන්වා තම ලොරි රථයේ රියදුරුට හා සේවකයකුට කොටුව දුම්රිය ස්ථානයට යන මෙන් දන්වන ලදී.

(අ) ඉහත සිද්ධියේ ඇතුළත් සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංගයක් වන ප්‍රතිචාරය සඳහා නිදසුනක් ලියන්න.

(ආ) ඉහත සිද්ධියේ ඇතුළත් සිල්ලර වෙළෙන්දා හා තොග වෙළෙන්දා වෙන වෙන ම නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) ජගත් ව්‍යායාම මංතීරුවේ ඇවිදිමින් සිටිය දී රු. 500 000 ක වටිනාකමකින් යුත් බිම වැටී තිබුණු මහජන බැංකුවේ චෙක්පතක් ඇහිඳ ගනු ලැබී ය. එම චෙක්පතේ මුහුණත 'රුවන් පෙරේරා' යන නම ලියා තිබූ අතර 'ආදායකයාගේ ගිණුමට පමණයි, ලංකා බැංකුව' යන යෙදුම සමාන්තර රේඛා දෙකක් අතර ලියා තිබුණි.

(අ) මෙම චෙක්පතෙහි අණලදු සහ ආදායකයා වෙන වෙන ම නම් කරන්න.

(ආ) මෙම චෙක්පතෙහි වටිනාකම බැංකු කවුන්ටරයෙන් මුදල් කර ගැනීමට කිසිදු පාර්ශ්වයකට නොහැකි ය. ඊට හේතුව කුමක් ද? (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

4. (i) සාමාන්‍ය කොටස්වල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) සැලසුම් කරන ලද ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමේ දී ව්‍යාපාරයේ මානව සම්පත නිසි ලෙස හැසිරවීමේ ක්‍රියාවලිය මෙහෙයවීමයි.

(ආ) ව්‍යාපාරයකට වඩාත් ආකර්ෂණීය මෙන් ම ලාභදායීව තෘප්තිමත් කළ හැකි වෙළෙඳපොළ කොටස ඉලක්ක වෙළෙඳපොළ වේ.

(ඉ) පුද්ගලයකු උපයාගත් ආදායමෙන් ඉතිරි කරගත් මුදලක්, යම් ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ඵලදායී මාර්ගයක යෙදවීම ආයෝජනය වේ.

(ඊ) රජය වෙනුවෙන් වාණිජ බැංකු විසින් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරනු ලැබේ. (ලකුණු 02 යි)

(iii) දසුන් තම කිතුල් හකුරු නිෂ්පාදන පිටකොටුව දුම්රිය ස්ථානය අසල විශේෂ වට්ටමක් සහිත ව සේවකයින් තිදෙනෙකු සමග අලෙවි කරන අතර, එක් එක් සේවකයා ඉටු කළ යුතු කාර්ය පිළිබඳ ව උපදෙස් දෙන ලදී.
ඉහත සිද්ධිය ඇසුරෙන්,

(අ) කළමනාකරණ කාර්යයක් වන මෙහෙයවීම සඳහා නිදසුනක් ලියන්න.

(ආ) අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයක් වන මිල සඳහා නිදසුනක් ලියන්න. (ලකුණු 02 යි)

(iv) අමල් සහ සමන් යන අයට ලොතරැයි දිනුමක් හිමි වී ඇති අතර ඔවුන් දෙදෙනා එය සම සමව බෙදා ගන්නා ලදී. අමල් තමාට ලද මුදලින් සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කර ඉතිරි මුදලින් ඉඩමක් මිල දී ගන්නා ලදී. සමන් තමාට ලද මුදලින් අඩක් කොළඹ කොටස් වෙළෙඳපොළේ සීමිත පොදු සමාගමක කොටස් මිල දී ගැනීමට යෙද වූ අතර ඉතිරිය ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කරන ලදී.

ඉහත සිද්ධියට අදාළ ව,

(අ) ප්‍රතිලාභයක් ලෙස පොලී ආදායමක් ලබන්නේ කවුරුන් ද?

(ආ) අමල් සහ සමන් යන දෙදෙනාට ම ලැබිය හැකි ප්‍රතිලාභයේ නම කුමක් ද? (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

[දහවැනි පිටුව බලන්න.

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

**5.** (i) ගිණුම්කරණයේ ප්‍රධානත ම අරමුණ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ව්‍යාපාරයක සිදු වූ පහත සඳහන් එක් එක් ගනුදෙනුව සටහන් කිරීම සඳහා භාවිත කරන මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත වෙන වෙන ම ලියන්න.

(අ) රු. 50 000 ක භාණ්ඩ තොගයක් අත්පිට මුදලට ගැනීම

(ආ) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු.100 000 ක ලී බඩු ණයට ගැනීම (ලකුණු 02 යි)

(iii) රාජුගේ ව්‍යාපාරයේ 2022.01.01 දිනට මුළු වත්කම් හා මුළු වගකීම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| මෝටර් රථය ........................................ | 250 000 |
| භාණ්ඩ තොගය ........................................ | 140 000 |
| ණයගැතියෝ ........................................ | 20 000 |
| මුදල් ශේෂය ........................................ | 100 000 |
| මුළු වගකීම් ........................................ | 30 000 |

2022 ජනවාරි මාසය තුළ රාජුගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දක්වා ඇත.

| දිනය | වත්කම් | | | | = හිමිකම | + වගකීම් |
|---|---|---|---|---|---|---|
| | මෝටර් රථ (රු.) | භාණ්ඩ තොගය (රු.) | ණයගැතියෝ (රු.) | මුදල් (රු.) | හිමිකම (රු.) | ණයහිමියෝ (රු.) |
| 01/05 | | + 9 000 | | | | + 9 000 |
| 01/10 | | | | – 10 000 | – 10 000 (රක්ෂණ ගාස්තු) | |
| 01/14 | | | – 7 000 | +7 000 | | |
| 01/20 | | | | – 8 000 | | – 8 000 |
| 01/25 | | – 15 000 | + 25 000 | | + 10 000 (ලාභය) | |

**අවශ්‍ය වන්නේ :**

(අ) 2022.01.14 දින සිදු වී ඇති ගනුදෙනුව වටිනාකම් සහිතව ලියන්න.

(ආ) 2022.01.25 දිනට ව්‍යාපාරයේ හිමිකමේ වටිනාකම කොපමණ ද?

(ඉ) 2022.01.25 දිනට ව්‍යාපාරයේ මුළු ජංගම වත්කම්වල වටිනාකම කොපමණ ද?

(ඊ) 2022.01.31 දින රාජුගේ ව්‍යාපාරයේ සිදු වූ පහත ගනුදෙනුව ඉහත ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න.
රාජු රු. 300 000 ක් වටිනා පෞද්ගලික මෝටර් රථය ව්‍යාපාරයට යෙදවීම (ලකුණු 04 යි)

(iv) නාරදගේ තොග වෙළෙඳ ව්‍යාපාරයේ 2022 ජනවාරි මාසයේ සිදු වූ විකුණුම් ගනුදෙනු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 2022.01.05 | භාණ්ඩ තොගයක් රු. 45 000 කට චාමරට ණයට විකිණීම | (ඉන්වොයිස් අංක. 520) |
| 2022.01.14 | භාණ්ඩ තොගයක් රු. 60 000 කට අත්පිට මුදලට විකිණීම | (ලදුපත් අංක. 428) |
| 2022.01.25 | භාණ්ඩ තොගයක් රු. 100 000 කට නුවන්ට ණයට විකිණීම වෙළෙඳ වට්ටම 5% | (ඉන්වොයිස් අංක. 521) |

**අවශ්‍ය වන්නේ :**

2022 ජනවාරි මාසය සඳහා නාරදගේ ව්‍යාපාරයේ,

(අ) විකුණුම් ජර්නලය

(ආ) විකුණුම් ගිණුම

(ඉ) මුළු විකුණුම් වටිනාකම (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

CamScanner

6. (i) ප්‍රාථමික පිරිවැයේ මූලිකාංග නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නිමල් කැන්වස් රෙදිවලින් බෑග් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් 2022.01.01 දින ආරම්භ කර, ඒ සඳහා රු. 120 000 ක් වටිනා යන්ත්‍ර උපකරණ මිලට ගන්නා ලදි. ජනවාරි මාසයේ නිෂ්පාදන වියදම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ගොඩනැගිලි කුලී ..................... | 20 000 |
| බෑග් මසන්නන්ගේ වැටුප් ........... | 60 000 |
| මුරකරු වැටුප ........................ | 25 000 |
| කැන්වස් රෙදි මිලට ගැනුම් ......... | 200 000 |
| බෑග් මෝස්තර නිර්මාණ වියදම් ...... | 30 000 |
| විදුලි වියදම ........................... | 8 000 |
| යන්ත්‍ර අලුත්වැඩියා වියදම් ........... | 14 000 |
| යන්ත්‍ර ක්ෂය ............................ | 3 000 |

ජනවාරි මාසය අවසානයේ ඉතිරි කැන්වස් රෙදි කිසිවක් නොමැති අතර, කැන්වස් බෑගයක පිරිවැය රු.1200 කි.

**අවශ්‍ය වන්නේ :**

ජනවාරි මාසයේ කැන්වස් රෙදි බෑග් නිෂ්පාදනයට අදාළ,

(අ) ප්‍රාථමික පිරිවැය

(ආ) පොදුකාර්ය පිරිවැය (ලකුණු 02 යි)

(iii) කසුන්ගේ ව්‍යාපාරය විසින් 2022.01.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| මුදල් ශේෂය ........................ | 110 000 | |
| විකුණුම් ........................... | | 540 000 |
| ගැනුම් .............................. | 300 000 | |
| දුරකථන ගාස්තු .................. | 8 000 | |
| වරිපනම් ගාස්තු ................. | 2 000 | |
| මෝටර් රථය ...................... | 250 000 | |
| ඉඩම් හා ගොඩනැගිලි ............ | 800 000 | |
| ණයහිමියෝ ....................... | | 60 000 |
| ප්‍රාග්ධනය .......................... | | 900 000 |
| අවිනිශ්චිත ගිණුම .............. | 30 000 | |
| | 1 500 000 | 1 500 000 |

ඉහත ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේ දී හඳුනාගත් ගිණුම්කරණ වැරදි පහත දැක්වේ.

(අ) ගෙවූ දුරකථන ගාස්තු රු. 6 000 ක් දුරකථන ගාස්තු ගිණුමේ රු. 8 000 ක් ලෙස සටහන් කර තිබීම

(ආ) ණයහිමියන්ට ගෙවූ රු. 16 000 ක් අදාළ ණයහිමි ගිණුමට බැර කර තිබීම

(ඉ) ගෙවූ ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් රු. 100 000 ක් ගොඩනැගිලි ගිණුමට හර කිරීම

**අවශ්‍ය වන්නේ :**

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුම

(ආ) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජර්නල් සටහන් (ලකුණු 04 යි)

(iv) 2022.03.31 දිනට ගයාන්ගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු. 24 000 ක් විය. නමුත් එදිනට ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය මෙයට වෙනස් විය. පසුව වෙනසට හේතු ලෙස පහත සඳහන් කරුණු අනාවරණය විය.

- බැංකුව විසින් ගයාන්ගේ ජංගම ගිණුමේ සටහන් නොකරන ලද චෙක්පත් :
  - තැන්පත් කළ නමුත් නිශ්කාෂණය නොවූ රු. 14 000 ක චෙක්පත
  - නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ රු. 15 000 ක චෙක්පත
- ගයාන්ගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් නොවූ ගනුදෙනු :
  - ස්ථාවර නියෝග මත බැංකුව ගෙවූ ණය වාරිකය රු. 10 000
  - සෘජුවම බැංකුවට ලැබූ ණයගැති ප්‍රේෂණ රු. 30 000

**අවශ්‍ය වන්නේ :**

(අ) 2022.03.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම

(ආ) 2022.03.31 දිනට ව්‍යාපාරයේ බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

/දොළොස්වැනි පිටුව බලන්න.

CamScanner

7. (i) ලාභ අරමුණු කර නොගත් සංවිධානයක පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශක්ති ක්‍රීඩා සමාජයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දෝෂ සහිතව පිළියෙල කළ ආදායම් ප්‍රකාශය පහත දැක්වේ.

| | රු. | රු. |
|---|---|---|
| **ආදායම්** | | |
| සාමාජික ගාස්තු .................. | 18 000 | |
| පරිත්‍යාග ලැබීම් .................. | 10 000 | 28 000 |
| **වියදම්** | | |
| ක්‍රීඩා තරග සඳහා වියදම් ......... | 8 000 | |
| විදුලි බිල් ගාස්තු .................. | 1 500 | |
| ප්‍රවේශ පත්‍ර ආදායම් .............. | 10 000 | (19 500) |
| ශුද්ධ ලාභය | | 8 500 |

**අමතර තොරතුරු :**

- මෙම ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් ගණන 100 කි.
- එක් අයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 200 කි.
- රු. 5 000 කට මිලට ගෙන ඇති ක්‍රීඩා උපකරණ වාර්ෂිකව 10% බැගින් ක්ෂය කිරීමට තීරණය කර ඇත.

**අවශ්‍ය වන්නේ :**

ශක්ති ක්‍රීඩා සමාජයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම. (ලකුණු 02 යි)

(iii) නිර්මලාගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| විකුණුම් ........................ | | 800 000 |
| ගැනුම් ........................ | 375 000 | |
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැයට) ........................ | 500 000 | |
| මෝටර් රථ (පිරිවැයට) ........................ | 600 000 | |
| ණයගැතියෝ ........................ | 9 000 | |
| ණයහිමියෝ ........................ | | 15 000 |
| ගොඩනැගිලි කුලී ........................ | 18 000 | |
| ලද වට්ටම් ........................ | | 5 000 |
| දුන් වට්ටම් ........................ | 2 000 | |
| විකුණුම් සේවක වේතන ........................ | 8 000 | |
| බැංකු ගාස්තු ........................ | 1 500 | |
| විදුලි ගාස්තු ........................ | 2 500 | |
| 10% බැංකු ණය ........................ | | 100 000 |
| ප්‍රාග්ධනය 2021.01.01 දිනට ........................ | | 624 000 |
| ගෙනුම් කුලී ........................ | 10 000 | |
| තොගය 2021.01.01 දිනට ........................ | 15 000 | |
| මුදල් ශේෂය ........................ | 3 000 | |
| | 1 544 000 | 1 544 000 |

**අමතර තොරතුරු :**

- 2021.12.31 දිනට ඉතිරි තොගයේ පිරිවැය රු. 20 000 කි.
- 2021.12.31 දිනට ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය රු. 2000 කි.
- මෝටර් රථ සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 20% බැගින් ක්ෂය කළ යුතු ය.

**අවශ්‍ය වන්නේ :**

(අ) 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04 යි)

(ආ) 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

* * *

CamScanner